සැ. යු. - 2012.04.20 දින පළ වූ අංක 1,755 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,756 - 2012 අප්‍රේල් මස 27 වැනි බදාදා - 2012.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 894 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 894 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අප්‍රේල් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

**උඩපළාත ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

**134(1) සහ (2) වැනි වගන්තිය යටතේ වරිපනම් බදු**

උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් පරිදි සියයට ප්‍රමාණය අනුව 2012 වර්ෂයට වරිපනම් බදු අයකරනු ලැබේ.

2012 පළමුවැනි කාර්තුව මාර්තු මස 31 දිනෙන් ද, දෙවැනි කාර්තුව ජූනි මස 30 දිනෙන් ද, තෙවන කාර්තුව සැප්තැම්බර් මස 30 දිනෙන් ද, හතරවන කාර්තුව දෙසැම්බර් මස 31 වැනි දිනෙන් ද අවසන් වේ. ඒ ඒ කාර්තුවල නියමිත දිනට පසුව වරිපනම් බදු ගෙවනු ලබන අයගෙන් 15%ක අධි ගාස්තුවක් අයකරනු ලැබේ.

2011 ජනවාරි මස 31 වැනි දිනට පෙර මුළු වර්ෂයටම වරිපනම් බදු ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10%ක වට්ටමක් ද, කොටස් වශයෙන් ගෙවන විට කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත් ගෙවනු ලබන මුදලින් 5%ක වට්ටමක් ද දෙනු ලැබේ.

| | *බද්දට යටත් වන ප්‍රදේශ* | *වාර්ෂික වටිනාකමින් සියයට ගණන* |
|---|---|---|
| 1. | පුස්සැල්ලාව උපකාර්යාල බල ප්‍රදේශය | 10% |
| 2. | දැල්පිටිය බල ප්‍රදේශය ( දැල්පිටිය, මාවතුර, පුපුරැස්ස, මිල්ලගහමුල) | 4% |
| 3. | දොළුව බල ප්‍රදේශය (පන්විලතැන්න, එගොඩකළුගමුව) | 4% |
| 4. | ගල්ගෙඩියාව බල ප්‍රදේශය (කීරපනේ, හපුගස්පිටිය) | 4% |

ඩී. ජී. ගුණසේන,
සභාපති,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 30 වැනි දින,
දැල්පිටිය අටබාගේ
උඩපළාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-618/1

---

# විවිධ දැන්වීම්

**මහනුවර මහ නගර සභාව**

බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු පැනවීම - සංශෝධනය කිරීම
2012 වර්ෂය

1979 අංක 42 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනතේ 1985 අංක 20 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනතින් වැඩිදුරටත් සංශෝධිත මහ නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරය) අංක 247 "අ" වගන්තිය ප්‍රකාරව මහනුවර මහ නගර සභාවේ පරිපාලන බලයලත් නිළධාරී විසින් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2012 වර්ෂයේදී අයකරනු ලබන බවට

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2011.11.04 දිනැති අංක 1731 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ පිටු අංක 1714 හි ප්‍රකාශයට පත් කර ඇති නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

පිටු අංක 1714 හි අංක 9 (ඇ) ඡේදය යටතේ

සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කර ඇති හෝ පිළිගනු ලැබ ඇති 2011 වර්ෂය තුළ පවත්වාගෙන ගිය හෝටලයක් 2012 වර්ෂයේ දී ද පවත්වාගෙන යාම වෙනුවෙන්,

2011 වර්ෂය තුළ හෝටලයක් පවත්වාගෙන යාමේදී ඉටුකරන ලද සැපයුම් හා සේවාවන් සඳහා ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදලින් 1/2%කට සමාන මුදලක් යන්න 0.25%කට සමාන මුදලක් අයකළ යුතු බවට සංශෝධනය කිරීමට මහනුවර මහ නගර සභාව විසින් 2012.02.27 දින අංක 8(25) දරන සභා සම්මුතිය මගින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තුෂාන්ත මහීන්ද්‍ර රත්වත්තේ,
පුරපති,
මහනුවර මහ නගර සභාව.

2012 අප්‍රේල් මස 04 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

04-652

**උඩපලාත ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

**147(2) වැනි වගන්තිය යටතේ ජල ගාස්තු**

උඩපලාත ප්‍රාදේශීය සභාව විසින් මෙම බල ප්‍රදේශ සීමාව තුළ ජල සැපයුම් සඳහා 2012 වර්ෂයට පහත සඳහන් පරිදි ජල ගාස්තු අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | රු. ශත |
|---|---|
| 1. නිවාස හා රජයේ ආයතන සඳහා (මසකට) | 75 0 |
| 2. ව්‍යාපාරික ස්ථාන සඳහා (මසකට) | 300 0 |

ඩී. ජී. ගුණසේන,
සභාපති,
උඩපලාත ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 30 වැනි දින,
දැල්පිටිය, අටබාගේ,
උඩපලාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-618/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.